# කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව
# முகாமைத்துவக் கணக்காய்வுத் திணைக்களம்
# DEPARTMENT OF MANAGEMENT AUDIT


මුදල් අමාත්‍යාංශය, මහලේකම් කාර්යාලය, කොළඹ 01

நிதி அமைச்சு, செயலகம், கொழும்பு 01

MINISTRY OF FINANCE, THE SECRETARIAT COLOMBO 01


මගේ අංකය / எனது இல / My No: DMA/AMC/2017/5/5

ඔබේ අංකය / உமது இல / Your No:

දිනය / திகதி / Date: 2019.06.21

සියලුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල වල

ප්‍රධාන අභ්‍යන්තර විගණකවරුන්/අභ්‍යන්තර විගණකවරුන් වෙත.

<u>වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම</u>

ඔබ අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම නිසිපරිදි ක්‍රියාවට නැංවීමේ අවශ්‍යතාවය කෙරෙහි ඔබගේ අවධානය යොමු කිරීමට කැමැත්තෙමි.

02. අනුමත වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම, අයවැය ඇස්තමේන්තුව, ප්‍රසම්පාදන සැලැස්ම අයවැය යෝජනා හා වෙනත් සංවර්ධන ව්‍යාපෘති යනාදිය සළකා බලා සෑම අංශයකම කටයුතු ආවරණය වන පරිදි අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කළ යුතු බව 2019.01.12 දිනැති අංක DMA / 01-2019 දරණ කළමනාකරණ විගණන චක්‍රලේඛය මගින් පෙන්වා දී ඇත.

03. ඒ අනුව ආයතන වල අරමුණු හා ඉලක්ක ලඟාකර ගැනීම සඳහා වන ක්‍රියාකාරකම් හා සැලසුම් කෙරෙහි අවධානය යොමු කර අභ්‍යන්තර විගණන සැලැස්මක් සකස්කර එය වසර පුරා අඛණ්ඩව ක්‍රියාවට නැංවීම මගින් අභ්‍යන්තර විගණනය වඩාත් කාර්යක්ෂමව හා ඵලදායීව සිදුකළ හැකි වේ.

04. කෙසේ නමුත් ආයතන වල ප්‍රධාන අභ්‍යන්තර විගණකවරුන්/අභ්‍යන්තර විගණකවරුන් ස්ථානමාරු වී යාමේදී, ප්‍රධාන ගණකාධිකාරීවරුන් ලෙස පත්ව යාමේදී, විශ්‍රාම යාමේදී යන අවස්ථාවන්හිදී එම තනතුරු යම් කාලයක් පුරප්පාඩුව පවතින විට අදාළ වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සැලසුම් කර ඇති ආකාරයටම ක්‍රියාත්මක නොවන බව නිරීක්ෂණය වන අවස්ථා දක්නට ලැබේ.


කාර්යාලය / அலுவலகம் / Office: 2484816, 2484500, 2484600, 2484700

අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் நாயகம் / Director General: 2484543

ෆැක්ස් / பெக்ஸ் / Fax: 2449496

වෙබ් අඩවිය / வெப் சைட் / website: www.treasury.gov.lk

05. එවැනි තත්වයක් යටතේ වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්මේ අපේක්ෂිත ඉලක්කයන් සපුරා ගැනීමට නොහැකි වන බැවින් වර්ෂය ආරම්භයේදී සකස්කර අනුමත කරගත් වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම (ප්‍රධාන අභ්‍යන්තර විගණක වරුන්/අභ්‍යන්තර විගණක වරුන් ඉහත පරිදි වෙනස් වුවද) අඛණ්ඩව පවත්වාගෙන යාමට අවශ්‍ය කටයුතු යෙදිය යුතු බව පෙන්වා දෙමි.

06. තවද ඉහත අංක 04 හි සඳහන් අවස්ථාවන් වලදී එම රාජකාරි ආවරණය කර ගැනීමේ වැඩපිළිවෙලක් පැවතිය යුතු අතර, අදාළ පුරප්පාඩුව සඳහා පැමිණෙන නව ප්‍රධාන අභ්‍යන්තර විගණක/අභ්‍යන්තර විගණක විසින් පවතින වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්මෙහි ක්‍රියාත්මක නොවී පවතින ස්ථානයේ සිට අදාළ සැලැස්ම නොකඩවා පවත්වා ගෙන යායුතු බවද පෙන්වා දෙමි.

06. එසේම යම් හේතුවක් මත වාර්ෂික අභ්‍යන්තර විගණක සැලැස්ම නිසිපරිදි ක්‍රියාත්මක කළ නොහැකි අවස්ථාවක් ඇතිවුව හොත් ඒ සඳහා සංශෝධිත අභ්‍යන්තර විගණන සැලැස්මක් සකස් කර එය අනුමත කරගත යුතු බවද වැඩිදුරටත් දන්වා සිටිමි.

07. තවද ඔබ ආයතනය විසින් අනුමත කරගෙන ක්‍රියාත්මක කරනු ලබන වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්මේ විගණන ක්‍රියාකාරකම් සඳහා විගණන වැඩසටහන් පිළියෙල කරගත යුතුවේ. එය 2019 වර්ෂයේ තුන්වන කාර්තුවේ සිට ඉදිරියට සකස් කර ගැනීමට කටයුතු කළයුතු අතර එම විගණන වැඩසටහන් පිළියෙල කරගැනීම තුළින් පැමිණෙන නවක නිලධාරීන් හට විගණන වැඩසටහන් භාවිතා කර විගණන කටයුතු වල පහසුවෙන් යෙදිය හැකි අතර විගණන සැලැස්ම නිසිපරිදි ක්‍රියාත්මක කරගැනීමේ හැකියාව පවතී. 2011.12.23 දිනැති කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක DMA/06 ප්‍රකාරව විගණන වැඩසටහන් සකස් කරගත හැකි අතරම ආදර්ශ විගණන වැඩසටහන් කිහිපයක් (2019.05.21 හා 2019.05.23 දිනැති) අප දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය මගින්ද ඔබට ලබාගැනීමේ හැකියාව පවතී. මේ සම්බන්ධව යම් පැහැදිලි කරගැනීමක් අවශ්‍ය වන්නේ නම් ඔබ ආයතනයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමට සහභාගී වන භාණ්ඩාගාර නියෝජිත මගින් සිදුකර ගත හැකි බවද තවදුරටත් දන්වා සිටිමි.

එස්.ජී. චන්ද්‍රිකා කුලතිලක
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත: කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ සියලුම භාණ්ඩාගාර නියෝජිතවරු - අනුමත අභ්‍යන්තර විගණන සැලැස්ම වසර පුරා අඛණ්ඩව ක්‍රියාත්මක වන්නේදැයි නිරීක්ෂණය කිරීම සඳහා.